<u>සිසු හෙද පුහුණුවට අන්තර්ජාලය හරහා</u>
<u>අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්</u>

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හා **අන්තර්ජාලය හරහා අයදුම්පත සම්පූර්ණ කිරීම පිළිබඳ උපදෙස්** හොඳින් කියවන්න.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමේදී අයදුම්කරු සතුව තිබිය යුතු ලේඛන සහ තොරතුරු:**

**සෑම අයදුම්කරුවෙකුටම/අයදුම්කාරියකටම පහත දැක්වෙන ලේඛන සහ තොරතුරු තිබිය යුතුය -**

**ජාතික හැඳුනුම්පත**

**උස දැක්විය යුතුය (සෙ.මී. වලින්)**

**ඇමතුම් ලබාදිය හැකි ජංගම දුරකථන අංකයක්**

**ගෙවීම් සිදුකිරීමෙන් පසු බැංකුවෙන් ලද රිසිට්පත**

1. ජංගම දුරකථන අංකයක් ඇතුළත් කලයුතුය. අයදුම්කරුවෙකුට පියාගේ හෝ මවගේ හෝ සමීප පුද්ගලයෙකුගේ දුරකථන අංකයක් ඇතුළත් කල හැකිය.

2. **ගෙවීම් සිදුකිරීමෙන් පසු බැංකුවෙන් ලද රිසිට්පතෙහි පිටපතක්** අයදුම්කරු සතුව තිබිය යුතුය. අයදුම්කරුවන් / අයදුම්කාරියන් රු. 500/- ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරණ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට ගෙවිය යුතුය. මෙම ගාස්තු ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීම් කල හැකි අතර එසේ ගෙවා ලබාගත් ලදුපතෙහි මුද්‍රිත අංකය (000/PF000000/00/000) අයදුම්පතෙහි නියමිත ස්ථානයට ඇතුලත් කල යුතුය.

**අයදුම්පත ඉදිරිපත් කරන ක්‍රියාවලියේ පියවර:**

**අන්තර්ජාලය හරහා අයදුම්කිරීම ⟶ අයදුම්පත උඩගත (UPLORD) කිරීමෙන් අනතුරුව ලැබෙන අංක 5 කින් යුතු කේතය (සම්පූර්ණ කල අයදුම්පතෙහි පිටපත් පසුව ලබාගැනීමේ පහසුව සඳහා) සුරක්ෂිතව තබාගන්න.**

***සැ.යු. අන්තර්ජාල සම්බන්ධතාවයේ බාධා හේතුවෙන් හෝ වෙනත් හේතුවක් නිසා අයදුම්පත් සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලිය අවසන් කල නොහැකි වුව හොත්, එය නැවත නව අයදුම්පතක් ලෙස සම්පූර්ණ කලයුතුය.***

1. සම්පූර්ණ කල අයදුම්පත අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමෙන් පසුව එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන ඔබ සන්තකයේ තබාගන්න.

2. මෙවර සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය වෙත අයදුම්පත තැපෑලෙන් එවීම අවශ්‍ය නොවන බැවින් එසේ කිරීමෙන් වළකින්න.

**අන්තර්ජාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු වැදගත් කරුණු -**

1. ඔබ අයදුම්පත සම්පූර්ණ කලයුතු වන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

2. අන්තර්ජාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී භාවිතා කල ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කල යුතුය.

3. අදාල විභාග අංක ඇතුලත් කල පසු අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල පරිගණක මෘදුකාංගය තුළින් ස්වයංක්‍රීයව උත්පාදනය වේ කෙසේ වෙතත් එම ප්‍රතිඵල වල කිසියම් විෂමතාවයක් පවතීනම් අදාල විෂයන් සහ ශ්‍රේණීන් එම ස්ථානයට පහලින් වෙන් කර ඇති කොටුවෙහි සඳහන් කල යුතුය.

4. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ඔබට යම් ගැටළුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් සතියේ වැඩකරන දිනයන් හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 අතර කාලය තුල සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 693 955 ඇමතීමෙන් අවශ්‍ය උපදෙස් ලබාගත හැකිය.